**මාධ්‍ය නිවේදනය**

**COVID-19 පිළිබඳ වර්තමාන තත්ත්වය**

**2025.05.21**

පසුගිය සති කිහිපයේදී ආසියානු රටවල් කිහිපයක COVID-19 අසාදිතයන් සංඛ්‍යාවේ ඉහළ යාමක් පෙන්නුම් කර ඇති බව වාර්තාවේ. මෙම තත්ත්වයට ප්‍රජාව තුල රෝගයට මුහුණදීමේ ඇති හැකියාව අඩුවීම ඇතුළු සාධක කිහිපයක් හේතු විය හැකිය. මෙය සැලකිල්ලට ගනිමින්, සෞඛ්‍ය අමාත්‍යාංශය ජාතික මට්ටමින් සූදානම්වීම සහ මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර තීව්‍ර කර ඇත. දැනට ශ්‍රී ලංකාවේ නව COVID-19 ප්‍රභේදයක් ව්‍යාප්ත වීමේ අවදානමක් නොමැති බැවින් අනිසි බියක් ඇතිකර ගැනීමට අවශ්‍ය නොමැත.

COVID-19 සඳහා සායනික සාම්පල පරීක්ෂා කරනු ලබන ඒකාබද්ධ ශ්වසන ආවේක්ෂණය රට පුරා තෝරාගත් රෝහල්වල සිදුවෙමින් පවතී. එම ආවේක්ෂණයට අනුව දැනට, COVID-19 රෝගීන්ගේ වැඩිවීමක් පෙන්නුම් නොකරයි. තවද ශ්‍රී ලංකාවේ ඇතිවිය හැකි වසංගත තත්වයක් කල්තියා හඳුනා ගැනීමට රසායනාගාර ආවේක්ෂණ පද්ධතිය සක්‍රීයව ක්‍රියාත්මකවේ.

කලින්කලට අනෙකුත් ශ්වසන රෝග (උදා: ඉන්ෆ්ලුවෙන්සා) මෙන්ම, COVID-19 රෝගීන්ගේ වැඩිවීමක් ද ඇතිවිය හැකිය. දැනට සාමාන්‍ය ජනතාවට ඇති අවදානම අඩු මට්ටමක පවතී. කෙසේ වෙතත්, වැඩිහිටියන්, ප්‍රතිශක්තිකරණය අඩු පුද්ගලයින් සහ නිදන්ගත රෝග ඇති පුද්ගලයින් වැනි වැඩි අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිවැරදි සහ කාලීන තොරතුරු මහජනතාවට ලබාදීම සඳහා සූදානම්ව සිටී. ඇතිවිය හැකි වසංගත තත්ත්වයන්ට මුහුණ දීම සඳහා රෝහල් පද්ධතියද සූදානම්ව පවතී.

COVID-19 තත්ත්වයේ කාලයත් සමග සිදුවන වෙනස්කම් පිලිබඳ සෞඛ්‍ය බලධාරීන් අවධානයෙන් සිටින අතර, ඔවුන් නිලවශයෙන් ලබාදෙන තොරතුරු කෙරෙහි අවධානය යොමු කරන ලෙස මහජනතාවට දන්වා සිටිමු. නිතර අත් සේදීම, කැස්ස සහ කිවිසුම් යන විට නාසය සහ මුඛය ආවරණය කිරීම ඇතුළු මූලික සනීපාරක්ෂක පිළිවෙත් සහ ශ්වසන ආචාර විධි නිරන්තරයෙන් පවත්වා ගත යුතුය.